**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව**

**ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනය දීර්ඝ කිරීම සහ සුදුසුකම් ලැබීමේ නිර්ණායක සංශෝධනය කිරීම**

**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා මත්පැන් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වූ ආරක්ෂිත සලකුණු සහ ආරක්ෂිත සලකුණු කළමනාකරණ පද්ධතියක් (SFSFMS) සැපයීම, ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම සඳහා වූ ප්‍රසම්පාදනය**

**ලංසු කැඳවීමේ අංකය: ED/AC/20/F/19/2026**

**පූර්ව ප්‍රකාශිත දින: 2026 ජූලි 20 සහ 2026 අගෝස්තු 28**

1."ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා මත්පැන් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වූ ආරක්ෂිත විශේෂාංග සහ ආරක්ෂිත විශේෂාංග කළමනාකරණ පද්ධතියක් **(SFSFMS)** සැපයීම, ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම සඳහා වූ ප්‍රසම්පාදනය" වෙනුවෙන් ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනය **2026 ඔක්තෝබර් 06** දක්වා දීර්ඝ කර ඇත.

2.ලංසු **2026** ඔක්තෝබර් **06** වන දින ප.ව. **3.00** ට හෝ ඊට පෙර සුරාබදු දෙපාර්තමේන්තුව, **4** වන මහල, නො. **353,** කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයට භාර දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම, එනම් **2026** ඔක්තෝබර් **06** වන දින ප.ව. **3.00** ට සහභාගී වීමට කැමැත්ත පළ කරන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

**3.සංශෝධිත ගුණාත්මකභාවය සහ ආරක්ෂක අවශ්‍යතා:**

අ. ලංසුකරු **ISO 9001, ISO 14298** හෝ **HSSMS, ISO 27001,** ජාත්‍යන්තර ඔප්ටිකල් ටෙක්නොලොජීස් සංගමය **(IOTA) - (**පූර්වයෙන් ජාත්‍යන්තර හොලෝග්‍රෑම් නිෂ්පාදකයින්ගේ සංගමය **(IHMA)** ලෙස හැඳින්වුණු) සහ ජාත්‍යන්තර බදු මුද්දර සංගමය **(ITSA)** යන සහතික කිරීම් සහිත විය යුතුය.

ආ.**ISO 37001 (**අල්ලස් විරෝධී කළමනාකරණ පද්ධති) සහතිකය ලබා ඇති ලංසුකරුවන් සඳහා තාක්ෂණික ඇගයීමේදී ලකුණු වෙන් කරනු ලැබේ.

4.ප්‍රසම්පාදන ලේඛනයට අදාළ සංශෝධන අතිරේක ලේඛනයකට (ඇමිණුමකට) **(Addendum)** ඇතුළත් කරනු ලබන අතර, එය ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ **(EDSL)** පළ කර ප්‍රසම්පාදන ලේඛන මිලදී ගත් සියලුම අනාගත ලංසුකරුවන් වෙත ද ලබා දෙනු ඇත.

**සභාපති,**
උසස් මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව **(HLPC),**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව,
නො. **353,** කෝට්ටේ පාර,

CONFIDENTIAL DOCUMENT

රාජගිරිය.

**2026 සැප්තැම්බර් 14**

CONFIDENTIAL DOCUMENT